**දිට්වා ආපදා තත්වය මත මධ්‍යම පළාත තුළ සිදුවූ හානිය යථාවත් කිරීමට අවශ්‍ය අතිරේක කාර්යය මණ්ඩලය සඳහා තාක්ෂණ සේවයේ (සිවිල්) රැකියා අවස්ථා සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම. – 2026**

දිට්වා ආපදා තත්ත්වය මත මධ්‍යම පළාත් සභාව යටතේ වන ආයතන විසින් නඩත්තු කරන භෞතික සම්පත් සඳහා වූ හානිය යථාවත් කිරීමට අවශ්‍ය තාවකාලික කාර්ය මණ්ඩලය සඳහා තාක්ෂණ සේවයේ (සිවිල්) රැකියා අවස්ථා 50ක් සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. (මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව සඳහා 20ක්, මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා 10ක් සහ මධ්‍යම පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව සඳහා 20 ක් ලෙස)

**අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2026.07.31 වෙ.**

1. පොදු සුදුසුකම්
   - 1.1. අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
   - 1.2. 2026.07.31 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි අයෙකු විය යුතුයි.(2005.07.31 දිනට හෝ ඊට පෙර, 1996.07.31 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කළ හැකිය.)
   - 1.3. සෑම අයදුම්කරුවෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
   - 1.4. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පදිංචි අයදුම්කරුවෙකුට ඉල්ලුම් කළ හැකිය.
   - 1.5. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම තනතුරුවලට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් නොලබයි.
   - 1.6. සේවයට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

2. සුදුසුකම්:
   - 2.1. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

සියලු අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් **2026.07.31** දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|
| | අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම් | අ.පො.ස. (උ/පෙළ) සුදුසුකම් | |
| 2.1. මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්) කොන්ත්‍රාත් | සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව , ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. | 1. භෞතික විද්‍යා විෂයය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන් තුනකින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)<br>හෝ<br>2. ඉංජිනේරු තාක්ෂණවේදය විෂය | 1. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (N.D.T.) සම්පූර්ණ කර තිබීම.<br>හෝ<br>2. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව සම්පූර්ණ කර තිබීම.<br>හෝ<br>3. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු |

| | | | |
|---|---|---|---|
| | | ධාරාවට අයත් ඉංජිනේරු තාක්‍ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් දෙක සහිතව විෂයයන් තුනකින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්‍ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) | ඩිප්ලෝමාව<br>හෝ<br>4. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමාව සම්පූර්ණ කර තිබීම.<br>හෝ<br>5. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමුවන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම.<br>හෝ<br>6. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම<br>හෝ<br>7. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්‍ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම.<br>* සේවා ව්‍යවස්ථාවේ දක්වා ඇති ඉහත සුදුසුකම්වලට විකල්ප වශයෙන් රා.ප.ච 46/90 හි දක්වා ඇති සුදුසුකම් අදාළ වේ. |

3. ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන
   - 3.1. මෙහි ඇමුණුම අංක 01 මගින් දක්වා ඇති අයදුම්පත්‍රය
   - 3.2. උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපතක්
   - 3.3. ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපතක්
   - 3.4. අධ්‍යාපන සහතික වල සහතික කරන ලද පිටපත්
   - 3.5. වෘත්තීය සුදුසුකම් වලට අදාල සහතික වල සහතික කරන ලද පිටපත්

4. බඳවා ගැනීමේ ක්‍රමවේදය
   - 4.1. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව ලැබෙන අයදුම්පත් ප්‍රමාණය පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු ප්‍රමාණයක් නම් සුදුසුකම් පරික්ෂා කිරීමේ සම්මුඛ පරික්ෂණයක් මගින් ද, ලැබෙන අයදුම්පත් ප්‍රමාණය පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි නම් ව්‍යුහගත සම්මුඛ පරික්ෂණයක් මගින්ද කොන්ත්‍රාත් පදනමින් මෙම තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

5. සේවා කොන්දේසි
   - 5.1. දිට්වා ආපදා තත්වය මත මධ්‍යම පළාත තුළ සිදුවූ හානිය යථාවත් කිරීමට ආරම්භ කර ඇති වැඩසටහන් සඳහා අවශ්‍ය අතිරේක කාර්යය මණ්ඩලය සඳහා පමණක් කොන්ත්‍රාත් පදනමින් මෙම බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

5.2. 2026.12.31 දින දක්වා කාලයක් සඳහා පමණක් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලැබේ. අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී මෙම කොන්ත්‍රාත් පදනමින් ලබා දෙන්නා වූ පත්වීම අහෝසි කිරීම සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

5.3. මේ සඳහා ඉල්ලුම් කරන සියලුම දෙනා කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගැනීම අනිවාර්යයෙන්ම සිදුකරනු ලබන බවට නොසැලකිය යුතුයි.

6. වැටුප් පරිමාණ

මෙම තනතුර සඳහා 2025.03.25 දිනැති 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි උපලේඛන II අනුව තාක්ෂණ නිලධාරී III ශ්‍රේණියේ තනතුරට හිමි MN-3-2025 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවර වන රු. 52,250/- ක මාසික ගෙවීමක් සිදු කරනු ලැබේ. එහෙත් ඔබට ගෙවීම් කරනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන III හි සඳහන් පරිදි වේ. ඔබගේ කොන්ත්‍රාත් දීමනාව සමඟ ජීවන වියදම් දීමනාව එකතු කර ගෙවනු ලැබේ.

7. අයදුම්පත්‍රය ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට **2026.07.31** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ " **ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244,** කටුගස්තොට **පාර, මහනුවර** " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ " **දිට්වා ආපදා තත්වය මත මධ්‍යම පළාත තුළ සිදුවූ හානිය යථාවත් කිරිමට අවශ්‍ය අතිරේක කාර්යය මණ්ඩලය සඳහා තාක්ෂණ සේවයේ (සිවිල්) රැකියා අවස්ථා සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම– 2026** " යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

8. මෙම නිවේදනයේ ආවරණය වන/නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කොන්ත්‍රාත් පදනම මත පත්කරනු ලබන සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය ද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

9. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක,**
**ලේකම්,**
**රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
මධ්‍යම පළාත් සභාව.

2026 ජූලි මස 17 වැනි දින
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර, මහනුවර.